# සුරාබදු දෙපාර්තමේන්තුවේ

# වාර්ෂික වාර්තාව

*2008*

# *2008 වර්ෂය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ පාලන වාර්තාව*

## 1. හැඳින්වීම:

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ මෙහෙයවීම සහ මාර්ගෝපදේශකත්වය යටතේ සුරාබදු දෙපාර්තමේන්තුවට, රජයේ ප්‍රතිපත්ති හා ඒවාට අදාල සුරාබදු ආදායම් සුරැකීම හා එකතු කිරීම ඇතුළු කටයුතු සඳහා නෛතික අධිකාරය ලැබෙන්නේ ප්‍රධාන වශයෙන්ම ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 52 වෙනි අධිකාරිය වන සුරාබදු ආඥා පණතෙනි. මේ හැරුණු විට, 1999 අංක 8 දරණ දුම්කොළ බදු පණතෙහි අධිකාරිය පවත්වා ගැනීමේ වගකීම හා පොලිස් හා වෙනත් අදාල නියෝජිතායතනයන් සමග, වස, විෂ, අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණතෙහි අධිකාරිය බලාත්මක කිරීමේ සාමුහික වගකීමද, 2006 අංක 27 දරණ දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීමේ වගකීම ද දෙපාර්තමේන්තුවට පැවරී ඇති අනිවාර්ය කාර්යයෝ ය. පූර්වෝක්ත ආඥා පණත් හා පණත්වල සහ ඒවාට අනුසාංගික නීති, රෙගුලාසි, නිවේදන, නියෝග හා විධාන ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ බලධාරී ප්‍රධාන පෙලේ නියෝජිතායතනයක් වශයෙන් මෙම දෙපාර්තමේන්තුව ක්‍රියා කරයි. රටේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා වැය කිරීමට සැලකිය යුතු අය සම්භාරයක් රැස්කර දීමෙන් හා එකී ව්‍යවස්ථාවන් යටතේ ගැනෙන සෑම ආකාරයකම වැරදි වැලක්වීමෙන් හා ග්‍රහණය කිරීම තුලින් සමාජ ආරක්ෂාව සැලසීමෙහි සුවිශේෂ ජාතික මෙහෙවරක් ඉටු කිරීමේ කාර්යයක සුරාබදු දෙපාර්තමේන්තුව නිරත වෙයි.

## 2. ඉදිරි දැක්ම

ශ්‍රී ලංකාවේ, නීත්‍යානුකූල නොවන මත්පැන් හා මත්ද්‍රව්‍ය වලින් තොර සමාජයක් ගොඩනැගීමට දායක වීම.

## 3. මෙහෙවර

ශ්‍රී ලංකාවේ සුරා හා දුම්කොළ කර්මාන්තයන්හි කාර්යක්ෂම පාලනයක් තුලින් ආදායම එකතු කිරීමෙනුත්, මෙකී කර්මාන්තවල නීත්‍යානුකූල නොවන නිෂ්පාදනයන් වැලැක්වීමෙන්, ශ්‍රී ලංකාවේ සංවර්ධනයට හා සමාජ සුභ සාධනයට දායකවීමත්, වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීමෙන් සමාජ ආරක්ෂාව ලබා දීමත් ය.

**පරමාර්ථයන් :**

- අ. මත්පැන් හා දුම්කොළ වලින් ලැබෙන ආදායම ආරක්ෂා කර ගැනීම.
- ආ. සුරාබදු ආඥා පණත හා දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
- ඇ. වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත ක්‍රියාත්මක කිරීම.
- ඈ. දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම.

**ක්‍රියාකාරකම් :**

- අ. බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය , පාලනය හා ඒවායින් ලැබිය යුතු ආදායම එකතු කිරීම.
- ආ. සුරාබදු ආඥා පණත සම්බන්ධයෙන් නීතිය බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම.
- ඇ. දුම්කොළ නිෂ්පාදනාගාර අධීක්ෂණය හා පාලනය ඇතුළුව දුම්කොළ බදු පණත බලාත්මක කිරීම.
- ඈ. වස, විෂ, අබිං අන්තරායකාරී ඖෂධ ආඥා පණත බලාත්මක කිරීමේ නියෝජිත බලධාරියකු ලෙස කටයුතු කිරීම
- ඉ. දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත ක්‍රියාත්මක කිරීම

## 4. සංවිධාන ව්‍යුහය

2008.12.31 වන දිනට කාර්ය මණ්ඩලය මෙසේ විය:-

| | | |
|---|---|---|
| සුරාබදු කොමසාරිස් ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (ආදායම්) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (පාලන/මානව සම්පත්) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (පාලන) (ශ්‍රී.ලං.ප.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (මුදල්) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (අභ්‍යයන්තර විගණන) (ශ්‍රී.ලං.ග.සේ) | : | 01 |
| සහකාර සුරාබදු කොමසාරිස් | : | 07 |
| පරිපාලන නිලධාරී | : | 01 |
| සුරාබදු අධිකාරී | : | 10 |
| ප්‍රධාන සුරාබදු පරීක්ෂක | : | 32 |
| සුරාබදු පරීක්ෂක | : | 274 |
| සුරාබදු සැරයන් මේජර් | : | 14 |
| සුරාබදු සැරයන් | : | 67 |
| සුරාබදු නියාමක / කෝප්‍රල් | : | 436 |
| සුරාබදු රියදුරු | : | 59 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | : | 89 |
| අයවැය සහකාර | : | 01 |
| කාර්යාල සේවක සේවය | : | 37 |
| බංගලා භාරකරු | : | 04 |

## 5. මාණ්ඩලික වෙනස්කම්:

- ශ්‍රී.ලං.ප.සේ 1 පංතියේ, පී. ඩබ්ලිව් රාජපක්ෂ මිය, 2008.01.01 දින සිට සුරාබදු කොමසාරිස් (පාලන / මානව සම්පත්) ලෙස පත්ව සිටී.
- 2008 වර්ෂය තුලදී පහත නම් සඳහන් නිලධාරීන් රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී

| නිලධාරියාගේ නම | තනතුර | විශ්‍රාම ගත් දිනය |
|---|---|---|
| එම්.ආර් ගෝමස් මහතා | සුරාබදු අධිකාරී | 2008.01.15 |
| යූ.ඒ. මොහොමඩ් මහතා | සහකාර සුරාබදු කොමසාරිස් | 2008.02.10 |
| එම්.ඒ ආනන්දරූප මහතා | සුරාබදු පරීක්ෂක | 2008.09.15 |

## 6. මානව සම්පත් සංවර්ධනය:

සුරාබදු කොමසාරිස් (පාලන / මානව සම්පත්) යටතේ ක්‍රියාත්මක වන මෙම ඒකකයට, සහකාර සුරාබදු කොමසාරිස්වරයෙකු, සුරාබදු පරීක්ෂකවරයෙකු, සුරාබදු නියාමකවරයෙකු, කාන්තා සුරාබදු නියාමකවරියක් සහ සුරාබදු රියදුරෙකු අනුයුක්ත කර ඇත.

දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම සහ ආකල්ප සංවර්ධනය අරමුණු කොට ගෙන, විවිධ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම, සහ විදේශ ශිෂ්‍යත්ව සඳහා නිලධාරීන් යොමු කිරීම මෙම ඒකකයේ මූලික කාර්යභාරය වේ.

සංවිධානය කල පාඨමාලා :

| | පාඨමාලාව | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් | පුහුණුව ලැබූ ආයතනය |
|---|---|---|---|---|

| | | | | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| 1 | නවක පරීක්ෂක පුහුණුව | 2008.02.01 | - | 2008.05.10 | 84 | සුරාබදු විදුහල, පනාදරගම |
| 2 | උසස්වීම් ලද පරීක්ෂක පුහුණුව | 2008.08.17 | - | 2008.09.17 | 33 | සුරාබදු විදුහල, පනාදරගම |
| 3 | 1. සුරාබදු නියාමක කෝප්‍රල් පුහුණුව | 2008.09.01 | - | 2008.09.03 | 153 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | 2. සුරාබදු නියාමක කෝප්‍රල් පුහුණුව | 2008.09.22 | - | 2008.09.24 | 140 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 4 | 1. සුරාබදු පරීක්ෂක පුහුණුව | 2008.10.20 | - | 2008.10.22 | 109 | රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය |
| | 2. සුරාබදු පරීක්ෂක පුහුණුව | 2008.11.10 | - | 2008.11.12 | 74 | රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය |
| | 3. සුරාබදු පරීක්ෂක පුහුණුව | 2008.11.18 | - | 2008.11.20 | 70 | රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය |
| 5 | සහකාර සුරාබදු කොමසාරිස්/සුරාබදු අධිකාරී පුහුණුව | 2008.10.26 | - | 2008.10.27 | 26 | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| 6 | සුරාබදු සැරයන් මේජර්/සුරාබදු සැරයන් පුහුණුව | 2008.11.23 | - | 2008.11.27 | 43 | සුරාබදු විදුහල, පනාදරගම |
| 7 | පරිඝණක පුහුණුව | 2008.06.09 | - | 2008.06.14 | 27 | සුරාබදු පරිඝණක විද්‍යාගාරය |

බාහිර පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම :

| | පාඨමාලාව | කාල සීමාව | | | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ ආයතනය |
|---|---|---|---|---|---|---|
| 1 | උපාය සම්බන්ධී නායකත්වය | 2008.01.15 | - | - | 01 | - |
| 2 | ධනාත්මක හෙට දවස | 2008.05.23 | - | 2008.05.24 | 02 | මුදල් අමාත්‍යංශය |
| 3 | ධනාත්මක හෙට දවස | 2008.05.30 | - | 2008.05.31 | 05 | - එම - |
| 4 | ධනාත්මක හෙට දවස | 2008.06.13 | - | 2008.06.14 | 09 | - එම - |
| 5 | ධනාත්මක හෙට දවස | 2008.06.20 | - | 2008.06.21 | 16 | - එම - |
| 6 | ධනාත්මක හෙට දවස | 2008.08.29 | - | 2008.08.30 | 35 | - එම - |
| 7 | ඵලදායිතාවය සහ තත්ත්ව කළමනාකරණය | 2008.08.18 | - | 2008.08.29 | 01 | ස්ලිඩා ආයතනය |
| 8 | දුම්කොළ සහ මධ්‍යසාර පනත | 2008.11.15 | - | - | 50 | දුම්කොළ හා මත්ද්‍රව්‍ය අධිකාරිය |
| 9 | මානව හිමිකම් | 2008.12.10 | - | - | 07 | මානව හිමිකම් කොමිසම |
| 10 | සාමාන්‍ය කළමනාකාරිත්ව පුහුණුව | 2008.08.25 | | 2008.12.12 | 02 | ස්ලිඩා ආයතනය |
| 11 | ආපදා කළමනාකරණය | 2008.11.17 | - | 2008.11.28 | 01 | ස්ලිඩා ආයතනය |
| 12. | විනය පරිපාටිය | 2008.11.20 | - | 2008.11.24 | 02 | ස්ලිඩා ආයතනය |

විදේශ පුහුණු සඳහා යොමු කිරීම

| | පාඨමාලාව | කාල සීමාව | සහභාගී වූ නිලධාරීන් | පුහුණුව ලැබූ රට |
|---|---|---|---|---|

| | | | | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| 1 | ආර්ථික සංවර්ධනය | 2008.03.19 | - | 2008.04.05 | 01 | කොරියාව |
| 2 | කළමනාකාරිත්ව පුහුණුව | 2008.09.07 | - | 2008.09.13 | 34 | ඉන්දියාව |
| 3 | කළමනාකාරිත්ව පුහුණුව | 2008.10.05 | - | 2008.10.11 | 60 | ඉන්දියාව |
| 4 | පරිඝණක පුහුණුව | 2008.10.03 | - | 2008.10.21 | 01 | සිංගප්පූරුව |
| 5 | මත්ද්‍රව්‍ය පුහුණුව | 2008.10.19 | - | 2008.10.25 | 01 | ඉන්දියාව |
| 6 | මත්ද්‍රව්‍ය පුහුණුව | 2008.11.03 | - | 2008.11.06 | 01 | ඉන්දියාව |
| 7 | මත්ද්‍රව්‍ය පුහුණුව | 2008.11.23 | - | 2008.11.26 | 01 | ඉන්දියාව |

විශේෂ වැඩසටහන්

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | මත්ද්‍රව්‍ය නිවාරණය | 2008.06.26 | - | නිට්ටඹුව මහා විද්‍යාලය, නිට්ටඹුව | |
| 2 | ජංගම සේවය, බදුල්ල | 2008.07.08 | - | 2008.07.09 | ඌව පළාත |

මෙයට අමතරව,

01. ප්‍රාදේශීය සුරාබදු ඒකකයන්හි නීතිමය ගැටළු සඳහා සහයවීම, නීතිපති දෙපාර්මේන්තුවේ සහය ලබා දීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම,

02. දෙපාර්තමේන්තු චක්‍ර ලේඛණ නිකුත් කිරීමේ/කාර්ය සාධන හඳුන්වා දීමේ කටයුතු සහ ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කිරීම සහ සම්බන්ධීකරණය

## 7. යටිතල සංවර්ධනය (ගොඩනැගිලි)

අ. (බාහිර ප්‍රදේශ)

| කාර්යාලය | කාර්ය ස්වභාවය | වියදම (රුපියල්) |
|---|---|---|
| සුරාබදු සංකීර්ණය, ගාල්ල | ඉදි කිරීම් කටයුතු | 24,900,000.00 |
| සුරාබදු ස්ථානය, ඇල්පිටිය | -එම- | 9,722,100.00 |
| නගර කාර්යාලය, කොළඹ | ගරාජයක් ඉදි කිරීම | 751,870.00 |
| මත්ද්‍රව්‍ය නාශක අංශය, කොළඹ | වහල අළුත්වැඩියා කිරීම / සුරාබදු අධිකාරි කාර්යාලයේ අළුත්වැඩියාවන් සහ ජල ටැංකියක් සවි කිරීම | 2,464,309.00 |
| වවුනියාව සුරාබදු සංකීර්ණය | තාප්පයක් ඉදි කිරීම | 1,206,867.50 |
| කුරුණෑගල සුරාබදු සංකීර්ණය | ගරාජයට ආවරණ බිත්ති ඉදි කිරීම සහ නල ජලය ලබා ගැනීම | 2,159,636.00 |
| ගම්පොල සුරාබදු ස්ථානය | ඉඩමේ මැණුම් කටයුතු | 13,800.00 |
| මීරිගම සුරාබදු ස්ථානය | -එම- | 9,125.00 |
| මඩකලපුව සුරාබදු ස්ථානය | ගරාජයක් ඉදි කිරීම | 79,161.20 |

ආ. (ප්‍රධාන කාර්යාලය - කොළඹ 2)

| කාර්යාලය | කාර්ය ස්වභාවය | වියදම (රුපියල්) |
|---|---|---|
| සුරාබදු කොමසාරිස් (පාලන) කාර්යාලය | නවීකරණ කටයුතු | 92,920.00 |
| මානව සම්පත් අංශය | අළුත්වැඩියා කටයුතු | 111,550.00 |

| | | |
|---|---|---|
| සම්මන්ත්‍රණ ශාලාව | බුමුතුරුණු දැමීම | 253,000.00 |
| නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් (ආදායම්) කාර්යාලය | නවීකරණ කටයුතු | 75,325.00 |
| ප්‍රධාන කාර්යාලය | තීන්ත ආලේප කිරීම / අළුත්වැඩියාවන් සහ සාමාන්‍ය නඩත්තු කටයුතු | 299,410.00 |

ඇ. 2008 වර්ෂය තුළදී අළුතින් වාහන මිලදී ගැනීමක් සිදු නොවූ අතර, රේගු දෙපාර්තමේන්තුවෙන් රාජ සන්තක කරන ලද පහත සඳහන් වාහන 05 සහ බස් රථය, දෙපාර්තමේන්තුවට ලබා ගත් අතර, රුපියල් 301,760/- ක වියදමින්, සීමාසහිත රිචඩ් පීරිස් සහ සමාගම වෙතින් ත්‍රී වීලරයක් මිලට ගන්නා ලදී.

| | | |
|---|---|---|
| PB 6527 | - | වෑන් රථය |
| PB 6890 | - | එම |
| PB 7429 | - | එම |
| PB 7430 | - | එම |
| PB 7953 | - | එම |
| PB 7198 | - | බස් රථය |
| QO 2681 | - | ත්‍රී රෝද රථය |

## 8. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම

වර්තමාන සුරාබදු ප්‍රතිපත්තිය, මහින්ද චින්තන ප්‍රතිපත්ති රාමුව මත පදනම්ව සකස් වී ඇත. ඒ අනුව, මත්පැන් හා දුම්වැටි භාවිතය පාලනය සඳහා අවශ්‍ය කටයුතු, සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මත්පැන් පරිභෝජනය අධෛර්යමත් කිරීමේ පියවරක් වශයෙන්, මත්පැන් සඳහා අය කරනු බදු නිතිපතා වැඩි කරනු ලැබී ය. එසේම, නව සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම, සංචාරක මණ්ඩලය අනුමත කරනු ලබන හෝටල්වලට පමණක් සීමා කර ඇත.

2003 වර්ෂයේ සිට අළුතින් වාර්ෂිකව නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව මෙසේ ය.

**වගුව 8.1**

| වර්ෂය | අළුතින් නිකුත් කරන ලද බලපත්‍ර ගණන |
|---|---|
| 2003 | 185 |
| 2004 | 203 |
| 2005 | 132 |
| 2006 | 35 |
| 2007 | 42 |
| 2008 | 36 |

සැර මත්පැන් නිෂ්පාදනය, පසුගිය වර්ෂවලදී වසරින් වසර වර්ධනයක් පෙන්නුම් කලද, ඉතිහාසයේ ප්‍රථම වතාවට 2008 වර්ෂයේ දී එය 2% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙම තත්ත්වය උදා වූයේ , 2005 වර්ෂයෙන් පසුව ඇති කරන ලද ප්‍රතිපත්ති නිසා ය. කෙසේ වෙතත්, බියර් නිෂ්පාදනයේ වර්ධනයක් 2008 දී පෙන්නුම් කරයි. සැර මත්පැන් හා බියර් නිෂ්පාදනය, පසුගිය වර්ෂවල වර්ධනය වූ ආකාරය පහතින් දක්වා ඇත.

**වගුව 8.2**

| වර්ෂය | සැර මත්පැන් | | බියර් | |
|---|---|---|---|---|
| | ප්‍රමාණය සම්මත සැර ලීටර මිලියන | වර්ධන ප්‍රතිශතය % | ප්‍රමාණය ලීටර මිලියන | වර්ධන ප්‍රතිශතය % |
| 2003 | 32.0 | - | 47.8 | - |
| 2004 | 34.5 | 8 | 48.3 | 1 |
| 2005 | 38.5 | 11 | 51.5 | 6 |
| 2006 | 45.4 | 18 | 46.9 | -9 |
| 2007 | 47.2 | 4 | 49.7 | 6 |
| 2008 | 45.7 | -2 | 57.3 | 15 |

සුරාබදු බලපත්‍ර නිකුත් කිරීම්, පනත් සහ ආඥා පනත් ක්‍රියාත්මක කිරීමේ දී, උසාවි දඩ වශයෙන් එකතු කරන මුදල්, මුළු ආදායම හා සැසඳීමේ දී සුළු ප්‍රතිශතයක් වන අතර එම ආදායම් බැර වනුයේ අදාල පළාත් සභා අරමුදල්වලට ය. එකී ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය දක්වා ඇත.

වගුව 8.3

| වර්ෂය | බලපත්‍ර ගාස්තු (රු. මිලියන) | දඩ මුදල් (රු.මිලියන) | එකතුව (රු.මිලියන) |
|---|---|---|---|
| 2003 | 177 | 75 | 252 |
| 2004 | 212 | 79 | 291 |
| 2005 | 231 | 91 | 322 |
| 2006 | 355 | 176 | 531 |
| 2007 | 357 | 269 | 626 |
| 2008 | 379 | 244 | 623 |

දෙපාර්තමේන්තුව විසින් දේශීය කර්මාන්ත සඳහා ස්ප්‍රීතු නිකුත් කිරීමේ දී, ලීටරයකට රු. 200/- ක බද්දක් ද, විදේශීය නිෂ්පාදන සඳහා ස්ප්‍රීතු නිකුත් කිරීමේ දී ලීටරයකට රු. 100/- ක බද්දක් ද අය කරනු ලබයි. ඒ අනුව ස්ප්‍රීතු නිකුත් කිරීම්වලදී බදු වශයෙන් 2008 වර්ෂයේ දී උපයා ඇති ආදායම රුපියල් මිලියන 343.2 කි.

සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේ දී නිකුත් කරනු ලබන අයදුම් පත්‍රයක් සඳහා රු. 7500/- ක මුදලක් අය කරනු ලබයි. බලපත්‍ර ස්ථානයක් ස්ථාන මාරු කිරීමේ දී රු. 100,000/- ක මුදලක් අය කරනු ලැබේ. තවද, බලපත්‍රයක් වෙනත් පුද්ගලයෙකුට පැවරීමේ දී, ර.බි 04 බලපත්‍රයක් සම්බන්ධයෙන් රු. 500,000/- ක මුදලක් ද, අනෙකුත් බලපත්‍ර සම්බන්ධයෙන් රු. 150,000/- ක මුදලක් ද අය කරනු ලැබේ. මෙසේ 2008 වර්ෂයේ දී එකතු කර ගත් මුළු ආදායම රුපියල් මිලියන 40.6 කි.

## 9. සුරාබදු ව්‍යුහය:

අංක 1 වගුව

| විස්තරය | ඒකකය | 2007.10.24 වන | 2008.10.08 වන |
|---|---|---|---|

| | | දිනට | දිනට |
|---|---|---|---|
| ඉක්ෂුපාක, තල් අරක්කු, පොල් සහ පදම් කල අරක්කු සම්මත ලීටරයකට | සම්මත ලීටර | 510/= | 560/= |
| විදේශීය මත්පැන් සම්මත ලීටරයකට | සම්මත ලීටර | 640/= | 690/= |
| මධ්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු බියර් තොග ලීටරයකට | තොග ලීටර | 38/= | 48/= |
| මධ්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි බියර් තොග ලීටරයකට | තොග ලීටර | 54/= | 64/= |
| වයින් ලීටරයක් සඳහා | ලීටර | 365/= | 415/= |
| දුම්කොළ මත සුරා බද්ද කි.ග්‍රෑ එකකට | කි.ග්‍රෑ.01 කට | 10/= | 10/= |
| බෝතල් රා | ලීටර 01 කට | 10/= | 10/= |

මෑත වර්ෂවල දෙපාර්තමේන්තුවේ ආදායම් සහ වියදම් තත්ත්වය:

| වර්ෂය | ආදායම (රු. මිලියන) | වියදම (රු. මිලියන) | ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| 2001 | 6,245.471 | 148.097 | 2.37 |
| 2002 | 8,541.628 | 151.395 | 1.77 |
| 2003 | 10,719.444 | 146.415 | 1.37 |
| 2004 | 13,545.502 | 173.000 | 1.28 |
| 2005 | 16,117.555 | 211.933 | 1.31 |
| 2006 | 20,694.008 | 297.000 | 1.44 |
| 2007 | 23,755.648 | 367.580 | 1.54 |
| 2008 | 27,436.152 | 372.023 | 1.35 |

10. **අභ්‍යන්තර විගණන ඒකකය :**

නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරයකුගේ අධීක්ෂණය යටතේ, රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුක්තව, අභ්‍යන්තර විගණන ඒකකය වර්ෂය තුල ක්‍රියාත්මක විණි. අදාල වර්ෂය තුල, සුරාබදු ප්‍රධාන කාර්යාලයට අදාලව, ලැබීම්, ගෙවීම්, සැපයුම්, සේවා සහ වත්කම් කළමනාකරණය යන ක්ෂේත්‍රයන් විගණනයට භාජනය කරන ලදී. ස්කාගාර, ගුදම් හා රා නිශ්පාදනාගාර ඇතුළු උප කාර්යාල 18 ක් විගණනයට භාජනය කරන ලදී. මීට අමතරව, විශේෂ විමර්ෂණ 04 ක් පවත්වන ලදී. මෙමගින් අදාල අණ පනත්, සුරාබදු නිවේදන, මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය ඇතුළුව නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස්වලින් බැහැරවීම් හඳුනාගෙන, ඒවාට අවශ්‍ය පියවර ගන්නා ලදී.

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් හා ප්‍රධාන කාර්යාලයේ සේවය කරන සියළුම මාණ්ඩලික නිලධාරීන්ගේ සාමාජිකත්වයෙන් යුක්තව, විගණන හා කළමනාකරණ කමිටුව 2008 වර්ෂය තුලදී තෙවරක් රැස්වී ඇත. විගණකාධිපති හා අභ්‍යන්තර විගණන විමසුම්වල ඇතුලත් නිරීක්ෂණ ඇතුළුව සම්පත් කළමනාකරණයේ දී මුහුණ දෙන ගැටළු සාකච්ඡාවට භාජනය කර, එළඹෙන තීරණ මත අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන, ඉලක්ක කරා යමින්, දෙපාර්තමේන්තුවේ අරමුණ සපුරා ගැනීමට කටයුතු කරන ලදී.

11. **භාණ්ඩ තොග පරීක්ෂණ :**

2007 වර්ෂයට අදාල සියළු භාණ්ඩ තොග පරීක්ෂණ කටයුතු 2008 වර්ෂය තුලදී අවසන් කරන ලදී.

12. දුම්කොළ බදු පනත සහ දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත යටතේ සිදු කරන ලද ග්‍රහණ විස්තර $ එ ` පරිශිෂ්ඨයේ ඇත.

13. **සුරාබදු හිඟ ආදායම් :**

2008 වර්ෂයේ අවසානය වන විට අයවීමට ඇති හිඟ සුරාබදු ආදායම් පිළිබඳ විස්තරයක් " ඒ " පරිශිෂ්ඨයේ ඇත. නියමිත වේලාවට සුරාබදු නොගෙවීම හේතුවෙන් මෙම තත්ත්වය උද්ගත වී ඇත. මෙම බදු මුදල් එකතු කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

14. **විගණන විමසුම් :**

2008 වර්ෂය අදාලව විගණකාධිපති විසින් විගණන විමසුම් 29 ක් යොමු කර ඇති අතර, ඒ සියල්ලටම පිළිතුරු සපයා ඇත. මෙම විගණන විමසුම්වලට, බඳවා ගැනීම්, වාහන අළුත්වැඩියා, ගොඩනැගිලි අළුත්වැඩියා සහ සේවා ලේඛණ පවත්වා ගෙන යාම වැනි කරුණු ද, තැගි අරමුදල, විසර්ජන ගිණුම, බැංකු ගිණුම සහ අත්තිකාරම් " බී " ගිණුම වැනි ගිණුම් පවත්වා ගෙන යාම පිළිබඳ කරුණු ඇතුලත් විය.

15. **දෙපාර්තමේන්තු වත්කම් :**

**දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි හා වත්කම් දැක්වෙන ලේඛණයක් " ඔ " පරිශිෂ්ඨයේ ඇත.**

16. අරමුදල් ගිණුම - $ඕ` පරිශිෂ්ඨය

17. අත්තිකාරම් ගිණුම - $ක` පරිශිෂ්ඨය

18. විසර්ජන ගිණුම - $ග` පරිශිෂ්ඨය

19. ආදායම් ගිණුම - $ජ` පරිශිෂ්ඨය

20. **වර්ෂය තුලදී භාවිතා වූ මත්පැන් බලපත්‍ර වර්ග:**

ඇ.

ර.බි 1 : ධාන්‍ය මත්පැන් නිෂ්පාදනය සඳහා බලපත්‍රය
ර.බි ඒ : විදේශීය ස්ප්‍රීතු මෙරට නිෂ්පාදනය සඳහා බලපත්‍රය
ර.බි බී : කිරි පොන්ස සහ/හෝ වයින් නිෂ්පාදනය සඳහා බලපත්‍රය
ර.බි සී : රා හැර, පොල් හෝ පොල් ආශ්‍රිත වෙනත් නිෂ්පාදිතයකින් පෙරන ලද ස්ප්‍රීතුවලින් විදේශ ස්ප්‍රීතු මෙරට සෑදීමට දෙන ලද බලපත්‍රය
ර.බි 3 : තොග වෙළඳ බලපත්‍රය
ර.බි 4 : සිල්ලරට විකුණුම් බලපත්‍රය
ර.බි 6 : බියර් පෝටර් බලපත්‍රය
ර.බි 7 : හෝටල් බලපත්‍රය
ර.බි 8 : හෝටල් පීඨිකා බලපත්‍රය
ර.බි 9 : විනෝද පීඨිකා බලපත්‍රය
ර.බි 10 : දුම්රිය භෝජනාගාර බලපත්‍රය
ර.බි 11 : ආපනාශාලා බලපත්‍රය
ර.බි 12 : තානායම් බලපත්‍රය
ර.බි 13 ඒ : ක්‍රීඩා සමාජ / සමාජශාලා බලපත්‍රය
ර.බි 14 : අවස්ථා බලපත්‍රය
ර.බි 15 : විකුණන වේලාවන් දීර්ඝ කිරීම සඳහා දෙන අතිරේක බලපත්‍රය
ර.බි 16 : වෙන්දේසිකරුවන්ගේ බලපත්‍රය
ර.බි 17 : පරිපාක ස්ප්‍රීතු බලපත්‍රය
ර.බි 18 : ඖෂධීය වයින් බලපත්‍රය
ර.බි 19 : විශේෂ බලපත්‍රය
ර.බි 22 ඒ : බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් සිල්ලරට විකිණීමේ බලපත්‍රය
ර.බි 22 බී : බියර්, ඒල්, ස්ටවුට් සහ වයින් ස්ථානීය පරිභෝජනය සඳහා බලපත්‍රය

ආ. නිෂ්පාදන බලපත්‍ර

පැසුනු, නොපැසුනු මී රා මැදීම, බා ගැනීම සහ නිෂ්පාදනය කිරීමට දෙන බලපත්‍රය

- ස්කාගාර බලපත්‍රය
- විනාකිරි බලපත්‍රය
- ස්ප්‍රීතු ශෝධනය කිරීම සංයෝග කිරීම, පදම් කිරීම පිලිබඳ බලපත්‍රය

ඇ. රා එකතු කිරීම සඳහා බලපත්‍රය

- එකතු කරන ස්ථාන බලපත්‍රය

ඈ. බෝතල්ගත කිරීම සඳහා බලපත්‍රය

- ➢ පැසවූ මත්පැන්
- ➢ පෙරූ මත්පැන්

ඉ. සහාය බලපත්‍රය

ඊ. කිතුල් ගස් පැසුණු රා නිෂ්පාදනය කර විකිණීමේ බලපත්‍රය

උ. විදේශ සංචාරක හෝටල් සහ ආපනශාලා බලපත්‍ර

| | |
|---|---|
| 'ඒ' ශ්‍රේණියේ හෝටල් | (ර.බි 7) |
| | (ර.බි 8) |
| 'බී' ශ්‍රේණියේ හෝටල් | (ර.බි 7) |
| | (ර.බි 8) |
| 'සී' ශ්‍රේණියේ හෝටල් | (ර.බි 7) |
| | (ර.බි 8) |
| 'ඒ ' ශ්‍රේණියේ ආපනශාලා | (ර.බි 11) |
| 'බී' ශ්‍රේණියේ ආපනශාලා | (ර.බි 11) |
| 'සී' ශ්‍රේණියේ ආපනශාලා | (ර.බි 11) |

ශ්‍රේණිය නොසලකා සංචාරක මණ්ඩලය අනුමත කල ස්ථාන (ර.බි 22 බී)

ඌ ටෙන්ඩර් මගින් විකුණනු ලබන රා තැබෑරුම්

## 21. 2008 වර්ෂයේ බලපත්‍ර දැරූ මත්පැන් නිෂ්පාදකයෝ

1. සීමාසහිත ඒ.ඊ.එෆ් (පුද්ගලික) සමාගම, අංක 324, හයිලෙවල් පාර, ගලගෙදර පාදුක්ක.
2. සීමාසහිත ඇක්මී ලංකා කම්පැනි, අංක 73/1, පරණ පාර, හංවැල්ල
3. සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි (ලංකා) සමාගම, මාවතගම
4. සමුපකාර ස්කාගාරය, පයාගල
5. ක්ලැසික් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, අංක 565, මිහිඳු මාවත, මාළඹේ
6. සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා, අංක 110, නොරිස් කැනල් පාර, කොළඹ 10.
7. හිඟුරාණ ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම, සමනබැද්ද, තිත්තපත්තර
8. සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම, කොතලාවල, කඩුවෙල
9. සීමාසහිත ලයන් බෲවරි සමාගම, අංක 254, කොළඹ පාර, බියගම
10. සීමාසහිත මනෝරි ලංකා කම්පැනි, අංක 277/1, ජයමාලපුර, ගම්පොල
11. සීමාසහිත මැකලම් බෲවරි (පුද්ගලික) සමාගම, පර්ල් වතුයාය, මීගොඩ
12. සීමාසහිත නිපොන් එක්ස්පෝ කම්පැනි, අංක 102, ශාන්ත ඇන්ඩෲ පාර, මෝදර, කොළඹ 15.
13. සීමාසහිත පෙරසිල් කම්පැනි, අංක 296/10, පාර්ක් පාර, කොළඹ 5
14. සීමාසහිත රන්දිය මාර්කටිං සර්විසස් (පුද්ගලික) සමාගම, අංක 7, පෙරුන්කුලිය මාවත දන්කොටුව.
15. සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම, අංක 255/86, කොරතොට, කඩුවෙල.
16. සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, අංක 25/20, මහවත්ත පාර, එගොඩ උයන, මොරටුව
17. සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සහ සමාගම, මෙස්ටිය, වාද්දුව
18. සීමාසහිත ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම, පස්සර පාර, විනීතගම, බදුල්ල.
19. තික්කම් ඩිස්ටිලරීස්, අල්වායි, පේද්‍රුරුතුඩුව
20. සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි, මිල්ලෑව, මොරගහහේන
21. වලිකාමම් ඩිස්ටිලරීස්, චංකානෙයි

22. සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සමාගම, වැලිසර, රාගම

## 22. නිෂ්පාදිත මත්පැන් ප්‍රමාණයන්

අංක 1 වගුව : මොලැසස් අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| හිගුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 24,947.46 | 13,001,421.60 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 101,446.93 | 52,360,088.60 |
| සීමාසහිත මනෝර් ලංකා සමාගම | 7,300.06 | 3,772,364.60 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 25,049.06 | 12,892,304.60 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 28,039.93 | 14,307,627.30 |
| ක්ලැසික් ඩිස්ටිලරීස් පුද්ගලික සමාගම | 16,186.38 | 8,322,651.30 |
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 15,455.24 | 8,043,559.90 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 290,941.33 | 152,285,687.30 |
| **එකතුව** | **509,366.39** | **264,985,705.20** |

අංක 2 වගුව : පොල් සහ පදම් කල අරක්කු:

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| ඒ.ඊ.එෆ් (පුද්ගලික) සමාගම | 378.98 | 193,279.80 |
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 4,639.83 | 2,454,413.80 |
| සමුපකාර ස්කාගාරය | 260.04 | 132,620.40 |
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 2,126,138.71 | 1,109,762,211.10 |
| හිගුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 4,398.82 | 2,291,801.20 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 441,244.04 | 230,730,895.12 |
| සීමාසහිත මනෝර් ලංකා සමාගම | 1,638.57 | 859,340.20 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 6,144.58 | 3,199,667.30 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 5,102.42 | 2,678,828.20 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 835,845.37 | 434,826,415.20 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 6,554.54 | 3,442,508.90 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 132.98 | 67,819.80 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 66,143.06 | 34,588,573.60 |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම | 519.30 | 264,843.00 |
| **එකතුව** | **3,499,141.24** | **1,825,493,217.62** |

අංක 3 වගුව : විශේෂ අරක්කු

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඇක්මී ලංකා සමාගම | 388,905.60 | 202,848,179.90 |
| ඒ.ඊ.එෆ් (පුද්ගලික) සමාගම | 38,376.32 | 20,668,616.80 |
| සමුපකාර ස්කාගාරය | 3,460.25 | 1,764,727.50 |
| ක්ලැසික් නිෂ්පාදකයෝ | 6,428.95 | 3,326,588.50 |
| සීමාසහිත ඩිස්ටිලරීස් කම්පැනි ඔෆ් ශ්‍රී ලංකා | 32,533,070.76 | 16,962,382,068.10 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 274,569.47 | 144,031,780.70 |
| හිගුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 392,392.15 | 204,978,416.00 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 2,576,594.22 | 1,340,950,216.93 |

| | | |
|---|---|---|
| සීමාසහිත මනෝරි ලංකා සමාගම | 108,640.61 | 56,540,323.60 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 138,843.57 | 72,386,202.20 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 894,840.38 | 465,532,128.80 |
| සීමාසහිත රන්දිය මාර්කටිං සර්විසස් පුද්ගලික සමාගම | 1,516.15 | 849,044.00 |
| සීමාසහිත රන්දෙනිගල ඩිස්ටිලරීස් සමාගම | 337,685.97 | 176,294,321.70 |
| ස්කොට්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 167,077.66 | 86,997,499.10 |
| සීමාසහිත ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම | 2,489.32 | 1,280,058.20 |
| සීමාසහිත ඌව ග්ලේන් කම්පැනි | 111,093.91 | 58,074,739.10 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 486,629.10 | 254,409,196.00 |
| **එකතුව** | **38,462,614.39** | **20,053,314,107.13** |

## 23. දේශීය නිෂ්පාදිත විදේශීය මත්පැන්

| නිශ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| හිඟුරාණ ඩිස්ටිලරීස් සමාගම - දොම්පේ | 1,281.29 | 848,004.10 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ටිලරීස් සමාගම | 1,605,038.70 | 1,059,378,684.64 |
| සීමාසහිත නිපොන් එක්ස්පෝ සමාගම | 969.48 | 641,536.70 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 785,746.67 | 512,743,483.30 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ටිලරීස් සමාගම | 825,283.88 | 538,860,715.70 |
| ශ්‍රී ලංකා ඩිස්ටිලරීස් සමාගම | 62,467.96 | 40,598,619.90 |
| සීමාසහිත ඩබ්.එම් මෙන්ඩිස් සහ සමාගම | 44,074.32 | 28,731,754.30 |
| **එකතුව** | **3,324,862.30** | **2,181,802,798.64** |

## 24. ධාන්‍ය මත්පැන් (බියර්) මද්‍යසාර ප්‍රතිශතය 5% ට අඩු

| නිශ්පාදන ආයතනය | ප්‍රමාණයන් ලීටර | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි ලංකා සමාගම | 897,679.10 | 36,077,345.80 |
| ලයන් බෲවරි සමාගම | 15,268,722.72 | 615,506,980.56 |
| මැකලම් බෲවරි සමාගම | 535,199.80 | 21,404,957.56 |
| **එකතුව** | **16,701,601.62** | **672,989,283.92** |

## 25. ධාන්‍ය මත්පැන් (බියර්) මද්‍යසාර ප්‍රතිශතය 5% ට වැඩි

| නිශ්පාදන ආයතනය | ප්‍රමාණයන් ලීටර | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| සීමාසහිත ඒෂියා පැසිෆික් බෲවරි ලංකා සමාගම | 7,726,257.00 | 434,070,144.00 |
| ලයන් බෲවරි සමාගම | 32,182,840.77 | 1,816,511,822.96 |
| මැකලම් බෲවරි සමාගම | 846,113.96 | 48,803,358.64 |
| **එකතුව** | **40,755,211.73** | **2,299,385,325.60** |

## 26. වයින්

| නිශ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ස.සැ.ලි) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| හෝම් ඩිලයිට් වයින් | 212.261 | 88,088.40 |
| ලංකා වයින් පුද්ගලික සමාගම | 6,665.750 | 2,501,404.71 |
| එස්.ඩී.ටී වයින් | 17.059 | 7,079.82 |

| | | |
|---|---|---|
| ශ්‍රී ලංකා කජු සංස්ථාව | 250.662 | 104,025.00 |
| **එකතුව** | **7,145.732** | **2,700,597.93** |

## 27. **බෝතල් රා නිෂ්පාදකයෝ**

බෝතල් ගත රා නිෂ්පාදකයන්ගේ නම් ද, නිෂ්පාදිත ප්‍රමාණයන් සහ අය කර ගන්නා ලද බදු මුදල් ද පහතින් දක්වා ඇත.

| නිෂ්පාදන ආයතනය | ප්‍රමාණයන් (ලීටර) | බදු මුදල (රු.ශත) |
|---|---|---|
| වයඹ සුපර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 541,055.000 | 5,410,550.00 |
| රීගල් බෝතල් රා නිෂ්පාදනාගාරය | 477,255.000 | 4,772,550.00 |
| එම්පයර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 24,185.000 | 241,850.00 |
| ගෝල්ඩන් රීගල් බෝතල් රා නිෂ්පාදනාගාරය, කොළඹ | 1,2440.00 | 124,400.00 |
| ගෝල්ඩන් රීගල් බෝතල් රා නිෂ්පාදනාගාරය, මාදම්පේ | 117,040.750 | 1,170,407.50 |
| හෝස් පවර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 381,395.000 | 3,813,950.00 |
| මනෝරි ලංකා බෝතල් රා නිෂ්පාදකයෝ | 1,121,925.000 | 11,219,250.00 |
| නිව් කමාන්ඩෝ බෝතල් රා නිෂ්පාදකයෝ | 6,141.250 | 61,412.50 |
| ෂූටින් ස්ටාර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 62,1540.00 | 6,215,400.00 |
| සිංහ බෝතල් රා නිෂ්පාදනාගාරය | 636,485.625 | 6,364,856.25 |
| ඒ.එම්.පී බෝතල් රා නිෂ්පාදනාගාරය | 106,538.125 | 1,065,381.25 |
| ටී.එස්.ආර් බෝතල් රා නිෂ්පාදනාගාරය | 915,540.000 | 9,155,400.00 |
| නිව් ටී.එස්.ආර් බෝතල් රා නිශ්පාදනාගාරය | 5,9310.00 | 593,100.00 |
| ත්‍රී ලයන් බෝතල් රා නිශ්පාදනාගාරය | 119,735.200 | 1,197,352.00 |
| උයිලන්කුලම බෝතල් රා නිශ්පාදනාගාරය | 2,709.750 | 27,097.50 |
| තෙල්ලිපලෙයි බෝතල් රා නිශ්පාදනාගාරය | 11,062.500 | 110,625.00 |
| අච්චුවේලි බෝතල් රා නිශ්පාදනාගාරය | 4,468.750 | 44,687.50 |
| මනිපායි බෝතල් රා නිශ්පාදනාගාරය | 17,063.750 | 170,637.50 |
| වංකානෙයි තල් සංවර්ධන සමුපකාරය | 40,757.500 | 407,575.00 |
| කමාන්ඩර් බෝතල් රා නිශ්පාදනාගාරය | 117,615.000 | 1,176,150.00 |
| **එකතුව** | **5,334,263.20** | **53,342,632.00** |

## 28. **ස්ප්‍රීතු**

අංක 1 වගුව : පොල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතු

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිශ්පාදිත ස්ප්‍රීතු සංශුද්ධ මධ්‍යසාර ලීටර |
|---|---|---|
| ඇක්මී ස්කාගාරය | 224,575.400 | 16,613.200 |
| බේරුවල ස්කාගාරය | 10,591,120.100 | 796,464.000 |
| සමුපකාර ස්කාගාරය | 1,430,047.000 | 97,875.000 |
| මෙස්ට්‍රිය ස්කාගාරය | 4,405,850.000 | 355,424.300 |
| රොක්ලන්ඩ් ස්කාගාරය | 8,704,130.000 | 780,599.000 |
| සීදුව ස්කාගාරය | 31,922,333.600 | 2,414,731.000 |
| **එකතුව** | **57,278,056.100** | **4,461,706.500** |

අංක 2 වගුව : තල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතු ප්‍රමාණය

| ස්කාගාරය | ශුද්ධ රා ලීටර | නිශ්පාදිත ස්ප්‍රීතු සංශුද්ධ මධ්‍යසාර ලීටර |
|---|---|---|

| | | |
|---|---|---|
| තික්කම් ස්කාගාරය | 1,429,482.750 | 51,439.800 |
| වරණි ස්කාගාරය | 95,426.250 | 5,203.100 |
| වලිකාමම් ස්කාගාරය | 1,577,022.750 | 70,942.200 |
| **එකතුව** | **3,101,931.750** | **127,585.100** |

අංක 3 වගුව : තල් රා වලින් ආසවනය කරන ලද ස්ප්‍රීතුවලින් නිශ්පාදිත තල් අරක්කු ප්‍රමාණය

| ස්කාගාරය | අරක්කු තොග ලීටර | අරක්කු සම්මත සැර ලීටර | බදු මුදල (රු.ශත) |
|---|---|---|---|
| තික්කම් ස්කාගාරය | 76,536.750 | 45,233.200 | 23,540,630.00 |
| වරණි ස්කාගාරය | 15,123.000 | 8,936.900 | 4,327,314.00 |
| වලිකාමම් ස්කාගාරය | 98,597.250 | 59,128.450 | 30,929,111.00 |
| **එකතුව** | **190,257.000** | **113,298.550** | **58,797,055.00** |

## 29. පරිපාක ස්ප්‍රීතු නිශ්පාදනය

| ස්කාගාරය | නිෂ්පාදන ප්‍රමාණය සංශුද්ධ මධ්‍යසාර ලීටර |
|---|---|
| පැල්වත්ත | 4,333,968.800 |
| සෙවනගල | 3,539,859.000 |
| **එකතුව** | **7,873,827.800** |

## 30. පරිපාක ස්ප්‍රීතු (අරක්කු නිශ්පාදනය සඳහා ආනයනය කරන ලද)

| සමාගම | ආනයනය කල තොග ලීටර ප්‍රමාණය |
|---|---|
| සීමාසහිත ඩිස්ට්ලරීස් කම්පැනි ඔප් ශ්‍රී ලංකා | 17,836,364.000 |
| සීමාසහිත ඉන්ටර්නැෂනල් ඩිස්ට්ලරීස් සමාගම | 2,256,765.000 |
| සීමාසහිත පෙරිසිල් පුද්ගලික සමාගම | 615,625.000 |
| සීමාසහිත රොක්ලන්ඩ් ඩිස්ට්ලරීස් සමාගම | 436,735.000 |
| ඇත්මී ලංකා පුද්ගලික සමාගම | 48,000.000 |
| හිඟුරාණ ඩිස්ට්ලරීස් පුද්ගලික සමාගම | 44,000.000 |
| **එකතුව** | **21,237,489.000** |

## 31. කර්මාන්තශාලා නිශ්පාදනයන් සඳහා නිකුත් කල පරිපාක ස්ප්‍රීතු / දුර්වල ස්ප්‍රීතු / නිහඩ ස්ප්‍රීතු

| ස්කාගාරය | පරිපාක ස්ප්‍රීතු ලීටර | දුර්වල ස්ප්‍රීතු | නිහඩ ස්ප්‍රීතු |
|---|---|---|---|
| හිඟුරාන ස්කාගාරය, කොරාඹේ | - | 343,500.000 | 633,835.000 |
| පැලවත්ත | 1,104,380.750 | - | - |
| සෙවනගල | 1,095,153.750 | - | - |
| **එකතුව** | **2,199,534.500** | **343,500.000** | **633,835.000** |

## 32. ස්වභාවය විකෘතිත ස්ප්‍රීතු ප්‍රමාණය

2008 වසර තුල, ස්වභාවය විකෘතිත ස්ප්‍රීතු නිශ්පාදනයක්, පැලවත්ත සහ සෙවනගල සීනි ආයතයන්හි සිදු වී නොමැත.

## 33. විනාකිරි නිශ්පාදනය

බලපත්‍ර ලද ගස් ගණන, නිශ්පාදිත විනාකිරි ප්‍රමාණය සහ විකුණුම් මිල (ඇ) පරිශිෂ්ඨයෙහි දැක්වේ.

## 34. දුම්කොළ නිශ්පාදනය සහ බද්ද

2008 වර්ෂයෙහි නිකුත් කරන ලද දුම්කොළ ප්‍රමාණය සහ අදාල බදු මුදල මෙසේ ය.

| නිශ්පාදනය (කි.ග්‍රෑ) | බදු මුදල (රු.ශත) |
|---|---|
| 3,235,593.000 | 32,320,827.00 |

## 35. විශේෂ මෙහෙයුම් ඒකකයේ කාර්යයන්

### අ. කොළඹ ඒකකය

සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අධික්ෂණය යටතේ, සුරාබදු අධිකාරීවරයෙකු යටතේ සුරාබදු ස්ථානාධිපති ඇතුළු සුරාබදු පරීක්ෂකවරුන් හය දෙනෙකුගෙන් හා සෙසු නිලයන් විසි එක් දෙනෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුතුව සිටී.

සුරාබදු කොමසාරිස් ජනරාල්තුමාට ලැබෙන මහජන පැමිණිලි විමර්ශණය කිරීම හා දිවයින පුරා සුරා අපරාධ මර්දනය කිරීමේ වගකීම මෙම ඒකකයට පැවරී ඇත. ඒ අනුව, 2008 වර්ෂය තුල මෙම ඒකකය මගින් සිදු කල අපරාධ ග්‍රහණ සංඛ්‍යාව 2311 කි. එය, විස්තරාත්මක වශයෙන් පහතින් දක්වා ඇත.

| | |
|---|---|
| නීති විරෝධි ස්ප්‍රීතු පෙරීම් | 288 |
| නීති විරෝධි ස්ප්‍රීතු ළඟ තබා ගැනීම් | 877 |
| නීති විරෝධි ස්ප්‍රීතු විකිණීම හා ළඟ තබා ගැනීම් | 675 |
| නීති විරෝධි රා විකිණීම් හා ළඟ තබා ගැනීම් | 10 |
| නීති විරෝධි රා ළඟ තබා ගැනීම් | 06 |
| නීති විරෝධි රා විකිණීම් | 105 |
| රජයේ අනුමත අරක්කු හා බියර් විකිණීම් (බලපත්‍ර රහිත) | 10 |
| අරක්කු ළඟ තබා ගැනීම් (බලපත්‍ර රහිත) | 05 |
| රජයේ අනුමත අරක්කු විකිණීම් (බලපත්‍ර රහිත) | 207 |
| නීති විරෝධි ලෙස ධාන්‍ය මත්පැන් හෙවත් බියර් විකිණීම | 34 |
| නීති විරෝධි ලෙස සාදන ලද මත්පැන් ළඟ තබා ගැනීම් | 45 |
| ගංජා ළඟ තබා ගැනීම් | 20 |
| නීති විරෝධි සිගරට් ළඟ තබා ගැනීම් | 05 |
| ග්‍රහණය කරන ලද ගංජා හේන් ප්‍රමාණය | 03 |
| වෙනත් වැරදි | 21 |
| එකතුව | 2311 |

2008 වර්ෂය තුලදී මෙම ඒකකය මගින් සිදු කරන ලද වැටලීම්වලින්, අපරාධ වාර්තා සම්බන්ධයෙන් රජයට අයකර දුන් දඩ මුදල රුපියල් 19,033,650/= කි. බලපත්‍ර ස්ථාන

සම්බන්ධයෙන් සිදු කරන ලද වැරදි සම්බන්ධයෙන් රජයට අයකර දුන් සමථ ගාස්තු මුදල රුපියල් 13,032,815/= කි.

2008 වර්ෂයේ දී මෙම ඒකකය විසින් ගංජා හේන් 08 ක් වැටලීමත්, නීති විරෝධී සිගරැට් වැටලීම් 05 ක් මගින් සිගරැට් 14400 ක් සහ ගංජා කිලෝ ග්‍රෑම් 340 ක ප්‍රමාණයක් අත් අඩංගුවට ගැනීමට සමත් වී ඇත.

ආ. <u>මධ්‍යම පලාත් ඒකකය</u>

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස් (මධ්‍යම පළාත) අධීක්ෂණය යටතේ, සුරාබදු ස්ථානාධිපතිවරයෙක්, සුරාබදු පරීක්ෂකවරුන් හතර දෙනෙක්, සුරාබදු සැරයන්වරයෙක්, සුරාබදු නියාමකවරුන් නව දෙනෙක්, සුරාබදු කාන්තා නියාමකවරියක් හා සුරාබදු රියදුරෙකුගෙන් සැදුම් ලත් කාර්යය මණ්ඩලයක් සේවයේ නියුක්තව සිටී. 2003 වර්ෂයේ ස්ථාපිත මෙම ඒකකය, දිවයින පුරාම විශේෂිත රාජකාරිවල නියුක්තව සිටී.

2008 වසරේදී සුරා වැටලීම් 2001 ක් සිදුකර පුද්ගලයින් 2001 ක් අත් අඩංගුවට ගෙන දඩ මුදල් ලෙස රුපියල් එක් කෝටි හැටහය ලක්ෂ අසූ නවදහස් හාරසිය පණහක් (16,689,450/=) රජයට අයකර දී ඇති අතර, මේ සඳහා නීති විරෝධී ලෙස පෙරීම් මධ්‍යස්ථාන 313 ක් වටලන ලදී. අක්කර 02 ක පමණ කංසා හේනක් වටලා, කංසා පැල 8245 ක් විනාශ කර ඇත.

දිවයිනේ පලාත් 05 ක් තුල, බලපත්‍ර ස්ථාන 522 ක් කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් වැටලීම් කටයුතු කර කාර්මික අපරාධ වාර්තා 522 ක් ඉදිරිපත් කර ඇත. මින් රුපියල් 12,428,780/= ක සමථ මුදලක් රජයට අයකර දීමට සමත් වී ඇත. මෙම ඒකකයේ කාර්යයන්, සමස්තයක් වශයෙන් 2007 වසරට වඩා ප්‍රගතියක් ලබා ඇත.

ඇ. දකුණු පලාත් ඒකකය :

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස්ගේ (දකුණු පළාත) අධීක්ෂණය යටතේ, ක්‍රියාත්මක වන මෙම ඒකකය සුරාබදු ස්ථානාධිපතිවරයෙක්, සුරාබදු පරීක්ෂකවරුන් තිදෙනෙකු හා සුරාබදු නියාමකවරුන් 05 කුගෙන් සමන්විත විය. අදාල වර්ෂය තුල මෙම ඒකකය විසින් ග්‍රහණ 802 ක් සහ බලපත්‍ර කොන්දේසි කඩ කිරීම් සම්බන්ධයෙන් කාර්මික අපරාධ වාර්තා 57 ක් ඉදිරිපත් කර ඇත. උසාවි දඩ වශයෙන් රු: 3,294,500/- ක් හා, කාර්මික අපරාධ වාර්තා සඳහා සමථ මුදල් වශයෙන් රු: 804, 700/- රජයට ලබා දී ඇත.

මාදු ගඟ ආශ්‍රිත බෙන්තර වල්අඹගල, ඇල්පිටිය, සහ හියාරේ ජලාශය ආදී ප්‍රධාන නීති විරෝධී මත්පැන් පෙරන ස්ථාන කිහිපයක් මෙම ඒකකයේ මැදිහත්වීමෙන් විනාශ කරන ලදී.

ඈ. වයඹ පලාත් ඒකකය :

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ, සහකාර සුරාබදු කොමසාරිස් (වයඹ පළාත) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම ඒකකය, සුරාබදු පරීක්ෂකවරුන් තිදෙනෙක්, සුරාබදු සැරයන්වරයෙක්, සුරාබදු කෝප්‍රල්වරයෙක් සහ සුරාබදු නියාමකවරුන් සතර දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයකින් සමන්විත ය. අදාල වර්ෂය තුල මෙම ඒකකය විසින්, ග්‍රහණ 772 ක් සිදුකර, අදාල වැරදි සම්බන්ධයෙන් පුද්ගලයන් 717 කට නඩු පවරා ඇත. උසාවි දඩ මුදල් වශයෙන් රු: 4,776,100/- ක මුදලක් අය ඇති අතර, අන්තරායකාරී ඖෂධ ආඥා පනත යටතේ ගංජා ග්‍රහණ 05 ක් සිදු කර ඇති අතර, ඒ සඳහා රු: 20,000/- ක දඩ මුදලක් අය කර ඇත.

## 36. නිෂ්පාදන මෙහෙයුම් ඒකකයේ කාර්යයන් සහ ප්‍රගතිය

සුරාබදු කොමසාරිස් ජනරාල් යටතේ පාලනය වන මෙම ඒකකයට, සහකාර සුරාබදු කොමසාරිස්වරයෙක්, ප්‍රධාන සුරාබදු පරීක්ෂකවරයෙක්, සුරාබදු පරීක්ෂකවරුන් සතර දෙනෙක්, කාන්තා සුරාබදු කෝප්‍රල්වරියක්, කාන්තා සුරාබදු නියාමිකාවක් සහ සුරාබදු රියදුරුවරයෙක් අනුයුක්තව සිටී. මීට අමතරව, ඔරුගොඩවත්ත ග්‍රේලයින් රේගු අංගනයේ ස්ප්‍රීතු ආනයනයට සම්බන්ධ සියළු කටයුතු කිරීම පිනිස, එක් සුරාබදු පරීක්ෂකවරයෙක් ඒ ඒ අවස්ථාවලදී සේවයෙහි යොදවන ලදී.

මෙම ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ, දිවයින පුරා විසිර පවතින සියළුම ස්කාගාර, අරක්කු, බියර්, රා සහ වයින් නිෂ්පාදනාගාරවල නිෂ්පාදන කාර්යයන් අධීක්ෂණය කිරීමත්, එමගින් සුරාබදු ආදායම අයකර ගැනීම සහ දිවයින පුරා පිහිටි තොග වෙළඳ බලපත්‍ර (ර.බි 03) පරීක්ෂාව සහ එහි පවතින වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කිරීම මෙන්ම සුරාබදු නීතියට අනුකූලව ඒවා පාලනය විය යුතු ආකාරය සම්බන්ධව දැනුවත් කිරීමත් සහ නිරන්තර අධීක්ෂණයට එම බලපත්‍ර ස්ථාන ලක් කිරීමත් ය.

තවද, මත්පැන් නිෂ්පාදනාගාර තොරතුරු සම්බන්ධව සංඛ්‍යා ලේඛණ පවත්වා ගෙන යාමත්, කාර්මික අපරාධ වාර්තාවලට අදාල තැගි මුදල් ගෙවීම සඳහා කටයුතු කිරීමත්, මෙම ඒකකයේ අධීක්ෂණය යටතේ සිදුකර ගෙන යනු ලබයි.

2008 වර්ෂය තුල ඉහත සඳහන් බලපත්‍ර ලත් ස්ථාන අධීක්ෂණය කිරීම තුලින් පැවති වැරදි සම්බන්ධව කාර්මික අපරාධ වාර්තා 94 ක් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා සමථ ගාස්තු වශයෙන් රුපියල් 4,822,000/- ක ආදායමක් රජයට ලබා දී ඇත. ඉලක්ක ගත කර ඇති සුරාබදු ආදායම ලඟා කර ගැනීම සඳහා මෙම ඒකකය විසින් මත්පැන් නිෂ්පාදන ආයතන නිරන්තර අධීක්ෂණයට ලක් කිරීම තුලින් අපේක්ෂිත බදු ආදායම් ඉලක්කය සපුරා ගැනීමට දායක වී ඇත.

## 37. මත්ද්‍රව්‍ය ඒකකයේ කාර්යයන්

වස විෂ අබිං හා අන්තරායකාරී ඖෂධ ආඥා පණත යටතේ නීතිය බලාත්මක කිරීම සඳහා පිහිටුවන ලද මත්ද්‍රව්‍ය ඒකකය කොළඹ ඩී.ආර් විජේවර්ධන මාවතේ ක්‍රියාත්මක වේ. සුරාබදු අධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ සුරාබදු ස්ථානාධිපතිවරයෙකු හා ආධුනික පරීක්ෂකවරුන් දෙදෙනෙකු ඇතුළුව, සුරාබදු පරීක්ෂකවරුන් පස් දෙනෙක් ද, සෙසු නිලයන් 14 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් මෙම ඒකකය සමන්විත විය.

2008 වර්ෂයේදී ග්‍රහණ 803 ක් සිදුකර ඇති අතර, ඒ මගින් මත්ද්‍රව්‍ය අපරාධකරුවන් ලෙස පිරිමි 659 ක් හා ගැහැණු 142 ක් අත්අඩංගුවට ගෙන ඇත. මෙම ග්‍රහණ 803 න් 522 ක් හෙරොයින් සම්බන්ධවූ ඒවා වූ අතර, 249 ක් ගංජා වැටලීම් වූ අතර, එක් ග්‍රහණයක් අබිං සම්බන්ධ ග්‍රහණයක් විය. සිද්ධීන් 95 සඳහා මහාධිකරණය ඉදිරියේ නඩු පැවරුනු අතර, දඩ මුදල් වශයෙන් රුපියල් 4,482,100/= ක් අයකර ගෙන ඇත.

## 38. සුරා අපරාධ

සමාලෝචිත වර්ෂය තුල දී, අපරාධ ග්‍රහණ 56445 ක් සිදු කර ඇති අතර, දඩ මුදල් වශයෙන් රුපියල් 244,476,700/- ක් අය කර ගෙන ඇත.

සුරා අපරාධ ග්‍රහණ 48610 ක්, මත් ද්‍රව්‍ය ග්‍රහණ 4789 ක් හා දුම්කොළ බදු පනත යටතේ ග්‍රහණ 1118 ක් ද, දුම්කොළ හා මධ්‍යසාර පිලිබඳ ජාතික අධිකාරී පනත යටතේ ග්‍රහණ 1928 ක් වශයෙන් ඉහත කී ග්‍රහණ 56445 ට ඇතුලත්ව ඇත.

## 39. පහරදීම් හා අවහිර කිරීම්

- දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකය විසින් අපරාධ වාර්තා 33/2008 ග්‍රහණය කිරීමේ දී, හම්බන්තොට, වැලිගත්ත, පල්ලේමලල ප්‍රදේශයේ දී සැකකරු කලහකාරී ලෙස හැසිරෙමින් රාජකාරියට බාධා කර ඇති අතර, සැකකරුට විරුද්ධව හම්බන්තොට මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත.

- අපරාධ වාර්තා 383/2008 ග්‍රහණය කිරීමේ දී, අක්මීමන, ගොනාමුල්ල ප්‍රදේශයේ දී, නිලධාරීන්ගේ රාජකාරියට බාධා වන අයුරින් කටයුතු සිදු වී ඇති අතර, ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත.

- දකුණු පළාත් විශේෂ මෙහෙයුම් ඒකකයට ලැබුණ මහජන පැමිණිල්ලක් විභාග කිරීමට ගිය නිලධාරියෙකුට බද්දේගම ප්‍රදේශයේ දී මැර ප්‍රහාරයකට ලක් වීමට සිදු වූ අතර, සැකකරුවන්ට එරෙහිව බද්දේගම අධිකරණයේ නඩු පවරා ඇත.

## සමාප්තිය

සමාලෝචිත වර්ෂය තුල දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද සුරාබදු ආදායම රුපියල් මිලියන 27,436 කි. මෙය 2007 වර්ෂයට වඩා 15% ක වර්ධනයකි. සිදු කරන ලද මුළු වැටලීම් සංඛ්‍යාව 56,445 කි. මේ අනුව, අදාල වර්ෂය තුලදී දෙපාර්තමේන්තු අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකිවීම ගැන සතුටු වෙමි.

දෙපාර්තමේන්තුවේ සාර්ථකත්වයට හේතු වූයේ සීමිත සම්පත් මනා ලෙස උපයෝගී කර ගනිමින් හා විධිමත් මානව සම්පත් කළමණාකරණයක් තුලින්, මෙහෙයුම් ක්‍රියාවලියේ ඇති කල ගුණාත්මක වර්ධනයයි.

ප්‍රතිපත්ති විධානයන් හා මාර්ගෝපදේශකත්වයන් සලසා දීමෙන් මාගේ ක්‍රියාකාරීත්වයට ශක්තිය ලබා දුන් අතිගරු ජනාධිපතිතුමාටත්, මුදල් හා රාජ්‍ය ආදායම් අමාත්‍යතුමාටත්, නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමාටත්, දෙපාර්තමේන්තුව නිසි මග මෙහෙයවීමෙන් හා මාගේ කාර්යභාරය සාර්ථක කර ගැනීමට ජවය ලබා දුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාටත්, සම්බන්ධීකරණය හා නිරන්තර උපදෙස් දීමෙන් බාධක මග හරවා ගැනීමට දායක වූ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරුන්ටත්, දෙපාර්තමේන්තුවේ කටයුතු සාර්ථක කර ගැනීමට නන් අයුරින් සහය දුන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමා ඇතුළු සියළුම නිලධාරීන්ට හා කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පුද කරමි.

දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය මට්ටමේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ලැබුන සහය අගය කරමි. තවද, දෙපාර්තමේන්තුව සමග සුහදව හා සමීපව කටයුතු කර, එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට සහය දැක්වූ ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය, නීතිපති දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, දුම්කොළ හා මධ්‍යසාර අධිකාරිය හා අනෙකුත් රාජ්‍ය ආයතනයන්ට මාගේ කෘතඥ පූර්වක ස්තූතිය පුද කර සිටිමි.

දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය සඳහා පුහුණු අවස්ථා සලසා දීමෙන් දායක වූ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය,රාජ්‍ය ගිණුම් හා මූල්‍ය ආයතනය, මානව හිමිකම් කොමිසම, අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාව, ජාතික මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් කමිටුව සහ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව යනාදී ආයතනයන්ට ද මාගේ කෘතඥතාවය හිමිවේ.

එමෙන්ම, ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රතිපාදන සපයන මූල්‍ය කළමණාකරණ ප්‍රතිසංස්කරණ වැඩසටහන විසින් මෙම දෙපාර්තමේන්තුවට ලබා දෙන ලද අනගි සහය පිලිබඳව ස්තූතිය පිරිනමමි.

අවසන් වශයෙන් මාගේ කටයුතු සාර්ථක කර ගැනීමට සහය වෙමින් දෙපාර්තමේන්තු අරමුණු මුදුන්පත් කර ගැනීමට දායකවූ දෙපාර්තමේන්තුවේ සියළුම ශ්‍රේණිවල නිලධාරීන්ට මාගේ විශේෂ ස්තූතිය හිමිවිය යුතුය.

**(වසන්ත හපුආරච්චි)**
**සුරාබදු කොමසාරිස් ජනරාල්**

-/විජේ